**ශීර්ෂය 171 - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව

2 කොටස - එක් එක් ශීර්ෂයට අදාළ විස්තරාත්මක වාර්තාව

**1 කොටස**

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව

---

**1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව**

| ශීර්ෂය | දෙපාර්තමේන්තුව |
|---|---|
| 214 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව |

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.31,619,141,503 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.26,377,590,135 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම පිළිවෙලින් රු.1,153,456,368 ක් හා රු.4,088,095,000 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 24 ක් හා සියයට 15 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2013 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයන් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| 171 | 4,778,491,503 | 3,625,035,135 | 1,153,456,368 | 24 |
| 214 | 26,840,650,000 | 22,752,555,000 | 4,088,095,000 | 15 |
| එකතුව | 31,619,141,503 | 26,377,590,135 | 5,241,551,368 | 17 |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය වෙත රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 17101 | 4,500,000 | 2,473,725 | 2,300,000 | 2,847,318 | 18,000,000 | 12,235,297 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ ශේෂය 22,266,528 ක් විය.

## 2 කොටස

-----------

**එක් එක් ශීර්ෂයට අදාළ විස්තරාත්මක වාර්තාව**

**1.** ශීර්ෂය 171 - උසස් අධ්‍යාපන **අමාත්‍යාංශය**

**1.1 විගණන විෂය පථය**

උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ඔක්තෝබර් 09 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකිම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරිම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන නිරීක්ෂණය**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා හා පොත් අනුව උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඈ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අතිරික්තතා**

**------------**

ප්‍රාග්ධන වැය විෂයයක හා පුනරාවර්තන වැය විෂයයන් 19 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදන පිළිවෙලින් රු.437,077,279 කින් හා රු.1,976,222 ක් වශයෙන් රු.439,053,501 කින් ඉක්මවා උපයෝජනයන් කර තිබුණි.

**(ආ) අයවැය විචලනය**

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයන් 13 ක් සඳහා සළසා තිබුණු රු.579,320,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයන් 11 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 ත් සියයට 99 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(iii) "පරිසර දූෂණය පාලනය කිරීම සහ මුඩුබිම් ගොඩ කිරීමේ වැඩ බිම්වල පාරිසරික ප්‍රතිසංස්කරණ කිරීමේ තාක්ෂණය සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘතිය" වෙනුවෙන් රුපියල් මිලියන 10 ක ප්‍රතිපාදන සළසා තිබුණි. එම ව්‍යාපෘතිය වෙනුවෙන් ශ්‍රී ලංකා රේගුව වෙත ගෙවන ලද රු.10,281,323 ක බදු මුදල 2013 වර්ෂයේ ආරම්භ කර නොතිබුණු "දැනුම ඇති සමාජයක් සඳහා අධ්‍යාපන ව්‍යාපෘතියේ" ආයෝජන ලෙස වැය විෂයයන් මාරු කර විසර්ජන ගිණුමේ සටහන් කර තිබුණි. මේ අනුව ආරම්භ නොකළ ව්‍යාපෘතියක් සඳහා වියදම් සටහන් කිරීමෙන් අදාළ ව්‍යාපෘතියේ වියදම් යථෝක්ත වටිනාකමින් අඩුවෙන් පෙන්වා තිබුණු අතර ව්‍යාපෘතිය වෙනුවෙන් සළසන ලද දේශීය අරමුදල් සඳහා වූ ශුද්ධ ප්‍රතිපාදනය ඉක්මවා රු.281,323 ක් වැය කර තිබුණි.

**(ඇ) පොදු තැන්පත් ගිණුම**

**--------------------------**

වර්ෂ 2ක් ඉක්ම වූ එකතුව රු.403,244 ක් වූ තැන්පතු 04 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**-------------------------------------------------------------------**

විෂය අංක 17101 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව වර්ෂ පහකට වැඩි අයවීම් හිඟහිටි තිබුණු ශේෂවල එකතුව

රු.307,980 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

## 1.4 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

### 1.4.1 21 වන සියවසට උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය

විසි එක් වන සියවස සඳහා වූ උසස් අධ්‍යාපන ව්‍යාපෘතියේ ණය ගිවිසුම් ප්‍රකාරව ඇස්තමේන්තුගත මුළු පිරිවැය එක්සත් ජනපද ඩොලර් මිලියන 40 ක් වී තිබුණි. ජාත්‍යන්තර සංවර්ධන සංගමය මඟින් මෙම මුදල මූල්‍යයනය කරනු ලැබේ. එහි සංරචක හතරක් විය. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 නොවැම්බර් 01 දින ආරම්භ කළ අතර 2015 දෙසැම්බර් 31 දින නිම කිරීමට නියමිතය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) මූල්‍ය කාර්යසාධනය**

මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.1,780,679,075 ක් වී තිබුණු අතර එය අපේක්ෂිත වියදමෙන් සියයට 38 ක මූල්‍ය ප්‍රගතියක් ලඟා කර ගෙන තිබුණි. එසේ වුවද ව්‍යාපෘති කාලයෙන් සියයට 61 ක් නිම වී තිබුණු බැවින් ව්‍යාපෘතියේ කාලය අවසන් වනවිට සැලැසුම්ගත ඉලක්ක කරා ලඟාවිය නොහැකි තත්ත්වයක් පවතින බව නිරීක්ෂණය විය.

**අරමුදල් උපයෝජනය**

| ප්‍රභවයන් | ණය ගිවිසුමේ මූල්‍යයනය කිරීම සඳහා එකඟ වූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | 2013 වර්ෂයේදී උපයෝජනය කළ අරමුදල් | 2013 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල් | | අරමුදල් උපයෝජනය ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | |
| ජා. සං. සං | 40 | 4,650 | 890 | 841.87 | 14.06 | 1,780.68 | 38 |
| **එකතුව** | **40** | **4,650** | **890** | **841.87** | **14.06** | **1,780.68** | |

(ආ) සංරචකයන්ගේ කාර්යසාධනය

ව්‍යාපෘතියේ සංරචකයන්හි මූල්‍ය කාර්යසාධනය සතුටුදායක ප්‍රගතියක් පෙන්වා නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| විස්තරය | 2013.12.31 දිනට සමුච්චිත ප්‍රතිපාදනය | 2013.12.31 දිනට සමුච්චිත වියදම | 2013.12.31 දිනට සමුච්චිත වියදම සමුච්චිත ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
| --- | --- | --- | --- |
| --------- | --------------- | --------------- | -------------------- |
| | රු. | රු. | |
| උසස් අධ්‍යාපන අංශය සඳහා ජාතික උසස් අධ්‍යාපන සුදුසුකම් රාමුවක් සංවර්ධනය කිරීම | 16,650,000 | 2,709,470 | 16 |
| සමස්ථ උසස් අධ්‍යාපන අංශය සඳහා තත්ත්ව සහතික යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම | 80,656,000 | 29,264,998 | 36 |
| තත්ත්ව හා නවෝත්පාදන ප්‍රදාන (Q1G) | 666,797,363 | 123,013,581 | 18 |
| ශ්‍රී ලංකා උසස් තාක්ෂණික ආයතන වැඩසටහන් නවීකරණය සහ කළමනාකරණය | 231,900,000 | 37,108,796 | 16 |

**(ඇ) ඉගැන්වීමේ හා ඉගෙන ගැනීමේ තත්ත්වය ප්‍රවර්ධනය කිරීම**

ඉගැන්වීමේ හා ඉගෙන ගැනීමේ තත්ත්වය ප්‍රවර්ධනය කිරීමේ සංරචකය යටතේ උසස් අධ්‍යාපනය පිළිබඳ ආර්ථික අදාළත්වය සංවර්ධනය කිරීම සඳහා සියළුම විශ්වවිද්‍යාලවලට, විශ්වවිද්‍යාල සංවර්ධන ප්‍රදාන වශයෙන් වර්ෂ 4 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට උපයෝජනය කළ යුතු අවම ඉලක්කය සියයට 75 ක් වුවත්, විශ්වවිද්‍යාල හයක් විසින් 2013 වර්ෂය අවසාන වන විට සියයට 40 කට වඩා අඩුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. එමෙන්ම බාහිර උපාධි වැඩසටහනෙහි වසර 04 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් වසර 02ක් අවසාන වනවිට සියයට 40 කට අඩු ප්‍රමාණයක් උපයෝජනය කර තිබුණි.

**(ඈ) භෞතික කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** උසස් අධ්‍යාපන අංශය සඳහා ආයතනගත නියමයන් සංරචකය යටතේ පාඨමාලාවල ජාතික සුදුසුකම් රාමුවක් සංවර්ධනය කිරීම හා ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අංශයේ ආයතනගත රාමුවක් සඳහා පනතක් සකස් කිරීම සම්බන්ධ කාර්යයන් සඳහා 2013 දෙසැම්බර් 31 දින වන විට රු.2,709,470 ක් වැය කර තිබුණද, එම කාර්යයන් 2013 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. එසේ වුවද, ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව නමින් සකස් කරන ලද චක්‍රලේඛයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්

නිකුත් කර තිබුණද උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනය විසින් ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

**(ii)** ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනය (SLIATE) නවීකරණය සඳහා ව්‍යාපෘතිය මගින් 2013 වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂිත නායකත්ව හා තත්ත්ව සංවර්ධන මධ්‍යස්ථානය (LQDC) ස්ථාපනය කිරීමේ කටයුතු 2014 අප්‍රේල් 30 දින වන විටත් **ඉටු කර නොතිබුණි.**

**(iii)** මානව සම්පත් සංවර්ධනය, නියාමනය හා ඇගයීම, අධ්‍යයන හා සන්නිවේදන සංරචකය යටතේ විශ්වවිද්‍යාල 05 ක ප්‍රදාන ලබාගත් කථිකාචාර්යවරුන් 06 දෙනෙකු විසින් සමාලෝචිත වර්ෂයේදී අධ්‍යයන කටයුතු සම්පූර්ණ කළ යුතු වුවද, එම කටයුතු 2014 අප්‍රේල් 30 දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණි.

**(iv)** ඉංග්‍රීසි හා තොරතුරු තාක්ෂණය පිළිබඳව උපාධි අපේක්ෂකයින්ගේ කුසලතා ඉහළ දැමීම සඳහා රු.8,543,252 ක පිරිවැයක් වූ වැඩ සටහනක, අදාල පරීක්ෂණ සඳහා සුදුසුකම් ලැබූ උපාධි අපේක්ෂකයින් 7,471 කගෙන් උපාධි අපේක්ෂකයින් 2,177 ක් පමණක් කථනය පරීක්ෂණයට (Speaking Tests) පෙනී සිටි අතර උපාධි අපේක්ෂකයින් 1,699 ක් පමණක් අදියර 4 ම සම්පූර්ණ කර තිබුණි.

**(ඉ)** **අනාර්ථික ගනුදෙනු**

--------------------

ව්‍යාපෘතියේ සේවා කාලය වර්ෂ තුනක් සම්පූර්ණ වූ විගසම සේවයෙන් ඉවත් වූ සේවකයන් 4 දෙනෙකුට එකතුව රු.386,818 ක් වූ පාරිතෝෂික දීමනා, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ විධිවිධානවලට පටහැනිව ගෙවා තිබුණි.

### 1.4.2 තාක්ෂණ අධ්‍යාපනය වැඩිදියුණු කිරීම හා යාවත්කාලීන කිරීම සඳහා වූ ව්‍යාපෘතිය

-----------------------------------------------------------------------------------------

තාක්ෂණ අධ්‍යාපනය වැඩිදියුණු කිරීම හා යාවත්කාලීන කිරීම සඳහා වූ ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව මට්ටක්කුලිය හා ලබුදූව උසස් තාක්ෂණ ආයතනයන්හි තාක්ෂණ අධ්‍යාපනය වැඩිදියුණු කිරීම හා යාවත්කාලීන කිරීම ව්‍යාපෘතියේ අරමුණ විය. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය යූරෝ මිලියන 27.6 ක් (රු.මිලියන 4,307.07) විය. ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය 2008 දෙසැම්බර් 31 දින ආරම්භ කර තිබූ අතර 2011 දෙසැම්බර් 31 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. 2011 වර්ෂයේ ව්‍යාපෘතියේ වියදම රු.307,108,910 ක් වූ අතර 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.3,442,926,331 ක් විය.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 වර්ෂය අවසානයට රු.4,435,730 ක් ව්‍යාපෘති කටයුතු සඳහා උපයෝජනය නොකර අමාත්‍යාංශය වෙත ආපසු එවා තිබුණි.

(ආ) 2011 වාර්ෂික අයවැය ඇස්තමේන්තු අනුව ව්‍යාපෘතිය සඳහා සළසා තිබුණු විදේශීය ආධාර ණය හා විදේශීය ආධාර ප්‍රදාන ප්‍රතිපාදනවලින් සියයට සියයක්ද, විදේශාධාර සම්බන්ධ දේශීය අරමුදල්වලින් සියයට 74 ක් ද, 2011 වර්ෂය අවසානයට ඉතිරි වී තිබුණි.

(ඇ) ව්‍යාපෘතියේ අරමුණු කරා ලඟාවීම සාක්ෂාත් කිරීම සඳහා ප්‍රතිපාදිත ව්‍යාපෘති අරමුදල් උපයෝගී කර ගනිමින් නිශ්චිත කාලපරිච්ඡේදයක් තුළදී ව්‍යාපෘතියේ මූල්‍ය හා භෞතික ඉලක්කයන් අරමුණු කරගත් කාර්තුමය හා අර්ධ වාර්ෂික වශයෙන් වූ විස්තරාත්මක සමස්ථ සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, එවැනි සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) 2011 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කාලය අවසන් වුවද, ව්‍යාපෘතියෙන් ලැබී තිබුණු රු.2,039,485,875 ක් වූ උපකරණ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයට පවරාගෙන නොතිබුණු අතර රු.772,987 ක ශේෂයක් 2013 දෙසැම්බර් 31 දින වන විටත් ව්‍යාපෘති බැංකු ගිණුමේ පැවතුණි.

### 1.4.3 ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය අදියර 1 - බී

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල අතර 2011 දෙසැම්බර් 20 දින එළඹි අංක 836 දරන ණය ගිවිසුම ප්‍රකාරව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රුපියල් මිලියන 1,812 ක් වූ අතර එයින් රුපියල් මිලියන 1,421 කට සමාන කුවේට් ඩිනාර් මිලියන 03 ක් මූල්‍යායණය කිරීමට අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල එකඟ වී තිබුණි. ශ්‍රී ලංකා රජයේ දායකය රු.මිලියන 391 ක් විය. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 සැප්තැම්බර් 01 දින ආරම්භ කරන ලද අතර 2015 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට තිබුණු අතර 2013 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 29.95 ක් වැයකර සියයට 1.65 ක මූල්‍ය ප්‍රගතියක් ලඟා කර ගෙන තිබුණි. භෞතික ප්‍රගතිය ශූන්‍ය තත්ත්වයක පැවතුණි.

### 1.4.4 ව්‍යාපෘති ආරම්භ කිරීමේ ප්‍රමාදයන්

ඇස්තමේන්තුගත අගය රු.මිලියන 306.7 ක් වූ ඉංජිනේරු පීඨය ස්ථාපිත කිරීම - කිලිනොච්චිය හා ප්‍රජාව පදනම් කරගත් උතුරු පළාත් කාන්තා සවිබල ගැන්වීම යන ව්‍යාපෘති දෙක උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කිරීමට නියමිතව තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 133.3 ක් ප්‍රතිපාදන මේ සඳහා සළසා තිබුණද, විවිධ හේතූන් නිසා එම ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

### 1.5 කාර්යසාධනය

වාර්ෂික සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව පිළියෙළ කර නොතිබුණි.

### 1.6 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

2013/2014 අධ්‍යන වර්ෂය සඳහා ප්‍රදානය කරන ලද විදේශ ශිෂ්‍යත්ව සංඛ්‍යාව 174 ක් වූ අතර සත්‍ය වශයෙන්ම ලබාගත් ශිෂ්‍යත්ව සංඛ්‍යාව 147 ක් විය. මේ අනුව භාර නොගත් ශිෂ්‍යත්ව සංඛ්‍යාව 27 ක් වී තිබුණි. එය ප්‍රදානය කළ ශිෂ්‍යත්ව සංඛ්‍යාවෙන් සියයට 16 ක් පමණ විය.

### 1.7 මානව සම්පත් කළමනාකරණය

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 24 | 17 | 07 |
| (ii) | තෘතියික මට්ටම | 02 | 01 | 01 |
| (iii) | ද්විතියක මට්ටම | 114 | 72 | 42 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 40 | 35 | 05 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 06 | 05 | 01 |
| | **එකතුව** | **186** | **130** | **56** |

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පුරප්පාඩු 56ක් පිරවීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

**(ආ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අනියම් කම්කරුවන් තිදෙනෙකු එම ආයතනයෙන් මුදා නොහැර අමාත්‍යාංශයේ රාජකාරී සඳහා යොදවා ගෙන තිබුණි.

## 2. ශීර්ෂය 214 - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

### 2.1 විගණන විෂය පථය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙළ කරන ලද්දකි.

### 2.2 ගිණුම් හා සැසැඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 2.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හි වූ පොදු නිරීක්ෂණය සහ පහත 2.4 හි සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(ඈ) අයවැය විචලනය**

--------------------

2013 වර්ෂය සඳහා මූලධන වියදම් වෙනුවෙන් සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 32 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

## 2.4 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

------------------------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 62 | 38 | 24 |
| (ii) | තෘතියික මට්ටම | 21 | 21 | - |
| (iii) | ද්විතියික මට්ටම | 156 | 98 | 58 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 50 | 43 | 07 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 04 | 04 | - |
| | **එකතුව** | **293** | **204** | **89** |

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පුරප්පාඩු 89 ක් පිරවීමට කොමිෂන් සභාව අපොහොසත් වී තිබුණි.